

# යටිහෙලගල-උඩගම තරුණ ගොවි සමාජය

''උනන්දු වෙතොත් ඔබත් සමාජයත් දියුණු තත්ත්වයකට පත් කිරීම ප්‍රධාන ලේකම් වන කේ. ඩබ්ලිව්. උභයසිංහ තරුණ ගොවි මහතාගේ විශ්වාසයයි.

මෑතකදී ජපන් රටේ කෘෂිකර්මාන්තය හා දියුණු තත්ත්වයකට පත් කිරීම අමාරු වැඩක් නොවේ'' යයි යටිහෙලගල — උඩගම ග්‍රාමීය තරුණ ගොවි සමාජයේ ප්‍රධාන ලේකම් වන කේ. ඩබ්ලිව්. උභයසිංහ තරුණ ගොවි මහතාගේ විශ්වාසයයි.

මෑතදී ජපන් රටේ කෘෂිකර්මාන්තය හා තරුණ ගොවි සංවිධානය පිළිබඳව ඉගෙනීමක් ලබා ගැනීම සඳහා පිටත් වූ දක්ෂ තරුණ ගොවි සමාජ නියෝජිතයන්ගේ මුල් ස්ථානය දරූ සාමාජිකයා යටිහෙලගලින් තේරුණේ සාමාජිකයන් ඔවුනොවුන්ගේ ද, සමාජයේ ද අරමුණුවලට විශෙෂ ලැදියා වක් ඇති හෙයින් බව මොනවට පැහැදිලි වේ.

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර කොට්ඨාශයේ යටිහෙලගල — උඩගම තරුණ ගොවි සමාජය 1958 සංශොධිත තරුණ ගොවි සමාජ ව්‍යවස්ථාව අනුව ලියාපදිංචිය ලත් පළමුවන සමාජවලින් එකක් වූයේ, තරුණ ගොවි සමාජ ප්‍රතිපත්ති නොලහා ඉටු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්ය.

යල, මහ දෙකන්නට සමාජය මගින් ආදර්ශමත් කුඹුරක් වගා කිරීමේදී, දියුණු ක්‍රමයක් යෙදීමේ ප්‍රතිඵල වශයෙන් 1958—59 මාස් කන්නයට අක්කරයකට වී බුසල් 60 ට අධික ප්‍රමාණයක් ලබා ගැනීම එතරම් විශාල අස්වැන්නක් නොවූවත්, ගමට ඇති සාමාන්‍ය අස්වැන්න සැලකූවිට මෙය සැලකිය යුතු, ආදර්ශමත් ප්‍රමාණයක් බව හැඟේ.

මීට අවුරුදු දෙකකට ප්‍රථම මුඩුබිම්වලට හා කැලෑ රොදුවලට යටිහෙලගල බෙහෙවින් ප්‍රසිද්ධව තිබුණි. දැනට එවැනි මුඩු බිමක් නැත් තරම නැත. වැඩිහිටියන්ගෙන් ද අනුදැනුම් හා අසහාය උදව් ද ලත් තරුණ ගොවීන් එවැනි ඉඩම් දැන් සාරවත් වගාවන්සේ පරිවර්තනය කර තිබේ. උඩරට සහ පහත රට එළවළු වර්ගයන්ද පැපොල්, කෙසෙල්, ආදිය ද වගා වී ඇති බව මෙම තරුණ ගොවි සමාජයෙන් වාර්තාවේ. සෑම ඉඩම් කැබැල්ලකටම පෝර වලක්ද තිබීම වගාවන් සාර්ථක කිරීමට

දරණ ප්‍රයත්නය සුලුපටු නොවන බව පෙන්වත්. ස්ථිර වගාවන් අතර ද පුනරුත්ථානයක් ගෙන දීමට මෙම තරුණ ගොවියෝ ක්‍රියා කර තිබේ. කෝපි ගස් කප්පාදු කිරීම හා පෝර කිරීම මෙහි විශෙෂාංගයක් වුණි. පළතුරු තවාන් ද සමහර සාමාජිකයන් විසින් ඇති කරන ලද්දේ ගමේ ප්‍රයෝජනයට පමණක් නොව අසල්වැසි ගම්මුන්ට ද පැළ අලෙවි කිරීමේ අටියෙනි.

මෙම සමාජය පිහිටුවායින් පසු සතුන් ඇති කිරීම ද මෑතක සිට අමුතුම සවරූපයක් ලැබ තිබේ. අංග සම්පූර්ණ "ඩිප්ලිටර්" කුකුල් කොටු තුනක් දැනටම තිබෙන්නේ තව තවත් සාමාජිකයෝ මෙම ව්‍යාපාරයට පා තබන පෙර නිමිති බව යයි ලේකම් මහතා ඉතා ආඩම්බර යෙන් පවසයි. එලිමහන් ක්‍රමයට ඇතිවෙන කුකුළන් ද ක්‍රම ක්‍රමයෙන් දියුණු ක්‍රම ලෙස පරිවර්තනය වෙන බව ද සඳහන් වේ. කිරි හරකුන් දෙදෙනෙකුට වඩා සමාජ ආරම්භයේ දී නොසිටිය මුත් දැන් තිහක් පමණ සිටීම මෙහි ද දියුණුව පිළිබිඹු කරයි.

සමාජයේ තරුණ ගොවීන් තිදෙනකුට මී පෙට්ටි 11 ක්ම තිබෙන අතර තව තවත් තරුණයින් මේ සඳහා යොමු වීමට ලැස්තිව සිටී. මී පැණි අලෙවි කිරීමෙන් සතුටු දායක මුදලක් ද එම තරුණ ගොවීන් තිදෙනා ලබත්.

යටිහෙලගල ග්‍රාමීය තරුණ ගොවි සමාජයේ විශෙෂාංගයක්ව තිබෙන්නේ සාමාජිකයන් විසින් අරමුණු රාශියක් සාර්ථකව හා ආදශී මත්ව ඉටු කිරීමය. වැඩිහිටියන්ගෙන් හා නායකයන්ගෙන් විශාල සේවයක් සමාජයට ලැබෙන බව ද මෙවැනි ප්‍රතිඵල වලින් ස්ථිර වේ.

සංගීත, නාට්‍ය හා විගඩම් ද තරුණ ගොවි සාමාජිකයන්ට පමණක් නොව ගම්මුන් සියලු දෙනාගේම විනෝදය පිණිස මෙම කායශූර තරුණ තරුණියන් විසින් සිරිත් වශයෙන් ඉදිරිපත් කෙරේ. සමාජයේ දියුණුව ක්‍රියාකාරී, සහාය හා ගැහැණු පිරිමි සියලු දෙනාගේම සිත් තුළ කාවැදී ඇති බව මෙම සමාජයෙන් රපෝර්තු වේ.

**National Digitization Project**

***National Science Foundation***

Institute : Department of Agriculture

1. Place of Scanning : Department of Agriculture, Peradeniya
2. Date Scanned : 2018/01/08
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. <u>Scanning Officer</u>

Name : N. S. Karunarathna

Signature : Sihara

<u>Certification of Scanning</u>

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

<u>Certifying Officer</u>

Designation : Chief Librarian

Name : Saumya Upamalika

Signature :

Date : 2018/01/08

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*